# 1951 අංක 25 දරණ පස සංරක්ෂණය පිළිබඳ ආඥා පනත

පසේ ප්‍රයෝජනය සංරක්ෂණය කිරීම. පස සෝදයාම වැළැක්වීම හෝ අඩු කිරීම හා ගංවතුරෙන් හා නියඟයෙන්වන හානිවලින් ඉඩම් ආරක්ෂාකර ගැනීම සඳහා විධිවිධාන යොදනු පිණිස පණවන ලද ආඥාපණතකි. (අනුමත කළ දිනය : 1951 අගෝස්තු 13) වර්තමාන පාර්ලිමේන්තුවට රැස්වූ උත්තර මන්ත්‍රී මණ්ඩලයේ හා නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ උපදේශය හා අනුමැතිය පරිදි එහිම බලය කරණ කොටගෙන අත්‍යුත්තම මහරජතුමන් විසින් මෙසේ පණවන ලදි :-

1. මෙම ආඥාපණත 1951 අංක 25 දරණ පස සංරක්ෂණය පිළිබඳ ආඥපණත නමින් හැඳින්විය හැකිය.

2. (1) පස සෝද යාමෙන්, ගංවතුරෙන් හා නියඟයෙන් පොළවටවන හානියේත්, ස්වභාවය හා ප්‍රමාණය නිශ්චයකර ගැනීමේ කාර්‍ය්‍ය සඳහාත්, සෝදපාලු ප්‍රදේශ හැටියට මෙම ආඥපණත මගින් ප්‍රකාශයට පත් කළ යුතු ප්‍රදේශ තීරණයකර ගැනීම අමාත්‍යවරයාට හැකි වීම සඳහාත්, පරීක්ෂණ හා විභාග පවත්වන්නට සැලැස්වීම අධ්‍යක්ෂ තැනගේ යුතුකම වන්නේ ය.

(2) අංක (1) දරණ උප වගන්තිය යටතේ කිසියම් පරීක්ෂණයක් හා විභාගයක් පැවැත්වීමේ කාර්‍ය්‍ය සඳහා අධ්‍යක්ෂ තැන විසින් ලිපියකින් බලය දෙන ලද කවර නිළධාරියෙකු වුවද ඔහුට ඉඩමකට නමුදු සෑහෙන කවර වේලාවකදී වුවද ඇතුල්වී පරීක්ෂා කිරීමත්, අවශ්‍ය විය හැකි අන්දමේ සියලුම පරීක්ෂණ හා විභාග එහිදී පැවැත්වීමත්, නීත්‍යානුකූල වන්නේය.

(3) මෙම ආඥපණතේ කාර්‍ය්‍ය සඳහා ආඥාවක් ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරමින් එහි විස්තරකර ඇති කවර ප්‍රදේශයක් වුවද සෝදපාලු ප්‍රදේශයක් හැටියට ප්‍රකාශ කිරීමට අමාත්‍යවරයාට පිළිවන.

(4) පහත සඳහන් කරුණු අරභයා, සියලුම සෝදපාලු ප්‍රදේශයන් සඳහා විශේෂ වශයෙන් හෝ අදලකර විය හැකිවන පරිද්දෙන් නියෝග සම්පාදනය කරන්නට අමාත්‍යවරයාට පිළිවන

(අ) පස සෝදයාම නැවැත්වීම හෝ පාලනය කිරීම සඳහා ප්‍රතිපාදිත ක්‍රියාමාර්ගයක් අනුගමනය කිරීමට ඉඩම් හිමියන්ට නියම කිරීම, ඇල දොළ උල්පත් ප්‍රදේශ හා ඉවුරුවල කැළෑ ඇති කිරීම, ඇල දොළ ඉවුරු දිගේ නියමිත පළලින් යුක්තවූ වගා නොකළ බිම්

තීරයක් ඉතිරි කිරීම, ඇල දෙළවල ඉවුරු දිගේ වැව්ලි ආරක්‍ෂා කිරීම, හරස් බැම්මවලින් හෝ වෙනත් මාර්ගයකින් ඇළ හැසිරවීම හා භූමි නිර්මාණය අනුව නියරවල් හා බිම් කණ්ඩි තැනීම පිළිබඳ ක්‍රියා මාර්ග ද මීට ඇතුළත් ය.

(ආ) ඉඩම් සහමුලින්ම වල් නෙලීම හෝ පස සෝදයාමට ඉවහල් වෙනත් කෘෂිකාර්මික ක්‍රියා තහනම් කිරීම හෝ සීමා කිරීම.

(ඉ) පස සෝදයාම නැවැත්වීමේ හෝ සීමා කිරීමේ හෝ ඇල දෙළවල උල්පත් ප්‍රදේශ හා ඉවුරු ආරක්‍ෂා කිරීමේ කාර්‍ය්‍ය සඳහා එසේ කිරීම අවශ්‍ය වූ අවස්ථාවලදී වගා කිරීමේ හෝ තෘණ බිම් වැවීමේ කටයුතු සඳහා ඉඩම් යෙදවීම සීමා කිරීම.

(ඊ) පස ආරක්‍ෂා කිරීම හා ගිනිවලින් සිදුවන අන්තරාය හෝ එයින් සිදුවන අලාභහානි අඩු කිරීම සඳහා කැලෑ හා තණ බිම් ප්‍රදේශ හානිදයක ලෙස ප්‍රයෝජනය ගැනීම තහනම් කිරීම හෝ සීමා කිරීම.

(උ) වගාකරනු ලබන වැව්ලිවල ස්වභාවය හෝ ක්‍රමය මෝසමෙන් මෝසම හෝ කාලයෙන් කාලය වෙනස් කිරීම සම්බන්ධයෙන් හෝ පස ආරක්‍ෂා කිරීමේ විධිවිධාන දියුණු කිරීමේ කාර්‍ය්‍ය සඳහා ගොවිතැන් ක්‍රම අනුගමනය කිරීම සම්බන්ධයෙන් උපදෙස් දීමට කිසියම් නියමිත නිළධාරියෙකුට බලය දීමද වේ.

5. කිසියම් සෝදපාලු ප්‍රදේශයක පිහිටි කිසියම් ඉඩමක් ගොවිතැනින් ඉවත්කළ යුතුයැයි හෝ එබඳු ඉඩමක හෝ එබඳු ඉඩමක් සම්බන්ධයෙන් පස සෝදයාම නැවැත්වීමේ හෝ අඩු කිරීමේ කිසියම් ක්‍රියා මාර්ගයක් ආණ්ඩුව මඟින් කළ යුතුයැයි හෝ අමාත්‍යවරයාට ඒත්තු ගිය කල්හී, එම ඉඩම පොදු කටයුත්තක් සඳහා අවශ්‍ය යයි ප්‍රකාශ කරන්නට අමාත්‍යවරයාට පිළිවන. එබඳු ප්‍රකාශයක් කළ ඉක්බිති, එම ඉඩම වෂී 1950 අංක 9 දරණ ආණ්ඩුවට ඉඩම් ලබා ගැනීමේ ආඥපණත යටතේ ආණ්ඩුවට ලබා ගනු ලැබේ. තවද එම පණතේ (2 වෙනි හා 3 වෙනි වගන්තිවල විධිවිධාන හැර) සෙසු විධිවිධාන යථා පරිදි අදාල වන්නේය.

6. පහත දැක්වෙන සියලුම කරුණු හෝ කිසියම් කරුණක් සඳහා නැතහොත් ඒ සම්බන්ධයෙන් නියෝග සම්පාදනය කරන්නට අමාත්‍යවරයාට පිළිවන

(අ) පසෙහි සාරවත් භාවය රැක ගැනීම හා දියුණු කිරී සඳහාත් පස මඟින් තෙතමන උරා ගැනීම පහසු කරවීම සඳහාත් ඉඩම් හිමියන් විසින් අනුගමනය කළ යුතු ක්‍රියා මාර්ග;

(ආ) සෝදපාලුවෙන් වන අලාභය නැවැත්වීම, අඩු කිරීම හෝ ඊට ප්‍රතිකර්ම යෙදීම් වශයෙන් ඉඩම් හිමියන් විසින් අනුගමනය කළ යුතු ක්‍රියා මාර්ග;

(ඉ) ඉඩමක සතුන් තණ කෑමෙන් එම ඉඩම වගාවට බාධාවක් වේ නම් නැතහොත් එසේ කෑමෙන් පසෙහි සාරවත් භාවය අඩු කිරීමේ ප්‍රමාණයට හෝ නැතහොත් එයින් පස සෝදයාමෙන් වන අලාභයට අනුබල ලැබේ නම් එම ප්‍රමාණයට පූර්වෝක්ත ඉඩමේ සතුන් තණ කෑම සීමා කිරීම;

(ඊ) ජලය හැරවීමට හෝ ජලය රැස්කර තැබීමට විධිවිධාන යෙදීමේ මාර්ගවලින් ගංවතුර පාලනය කිරීම හා නියගයෙන්වන හානි සීමා කිරීම ද, ගංවතුර පාලනය කිරීම හා ජලය රැස් කිරීම සඳහා ප්‍රාදේශික බල මණ්ඩල මඟින් අනුගමනය කර ඇති ක්‍රියාමාර්ග අන්‍යොන්‍ය වශයෙන් සම්බන්ධ කිරීම;

උ) තණ බිම් ගිනි තැබීම හා හේන් ගිනි තැබීමේදී ගිනි විහිද යාම තහනම් කිරීම නැතහොත් සීමා කිරීම;

(ඌ) තිබෙන ජලය ප්‍රවේසම් සහිතව පාවිච්චි කරනු ලැබීම ස්ථිර වනු පිණිස නියමිත ප්‍රදේශයන්හී බිම් කෙටීම හා ජල සම්පාදනය කිරීමේ කාලවල් නියම කිරීම හා ජල සම්පාදන මාර්ග නියම කිරීම;

(එ) වගා කරනු ලබන වගාවේ ආකාරය හෝ ස්වභාවය මෝසමෙන් මෝසම හෝ කලින් කල වෙනස් කිරීම හෝ පස ආරක්‍ෂා කිරීම දියුණු කරලීම සඳහා ගොවිතැන් ක්‍රම අනුගමනය කිරීම හෝ වෙනස් කිරීම පිළිබඳව උපදෙස් දීමට කිසියම් නියමිත නිලධාරියෙකුට හෝ පුද්ගලයෙකුට බලය දීම;

(ඒ) කිසියම් ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවක හෝ ප්‍රාදේශික බල මණ්ඩලයක පාලනය යටතේ පවත්නා මාර්ග හෝ අඩිපාර මැද උස්කොට තැනීම හෝ හරහට දිය අගල් දැමීම, නැතහොත් අගල් හා ජල මාර්ග ශුද්ධ කිරීම තහනම් කිරීම හෝ සීමා කිරීම ; හා

(ඔ) මෙම ආඥා පණතින් නියම කළ යුතු යයි ප්‍රකාශ වී හෝ අවශ්‍ය වී ඇති කිසිය කරුණක් ද වේ.

7. (1) කිසියම් ඉඩමක හෝ ඉඩමක් සම්බන්ධයෙන්, මෙම ආඥා පණත යටතේ කිසියම් නියෝගයක් මගින් කිසියම් ක්‍රියාමාර්ගයක් අනුගමනය කළ යුතු හැටියට නියම වී ඇති කල්හී, ඉදින් ඒ සම්බන්ධයෙන් සම්පාදිත නියෝග මගින් බලය ලැබී තිබේ නම් එබඳු නියෝග මගින් නියම කළ හැකි කොන්දේසි හා සීමා කිරීම්වලට යටත්ව, එබඳු ක්‍රියා මාර්ග සඳහා යන වියදම දැරීමට ඉඩම් හිමියාට උපකාර කිරීමක් වශයෙන් ණය මුදලක් දෙන්නට අධ්‍යක්ෂ තැනට පිළිවන.

(2) එම කාර්‍යය සඳහා පාර්ලිමේන්තුවෙන් වෙන්වී ඇති මුදල්වලින් මිස සෙසු මුදලකින් මෙම වගන්තියේ ඉහත දැක්වූ විධිවිධාන යටතේ කිසිම ණයක් නොදිය යුතුයි.

(3) මෙම වගන්තිය යටතේ ණය දිය හැකි කුමන ඈපයක් පිටද යන්නත්, එබඳු ණය වෙනුවෙන් ගෙවිය යුතු පොලියේ ප්‍රමාණයත්, නියම කරන්නාවූ ද, එම ණයවලින් ලැබිය යුතු පොලිය හා මුල් මුදල් ආපසු ගැනීම හෝ අයකර ගැනීම සඳහා විධිවිධාන සපයන්නා වූ ද, නියෝග සම්පාදනයකර ගත හැකිය.

8. (1) මෙම ආඥාපණත යටතේ ඒ සම්බන්ධයෙන් සම්පාදිත කිසියම් නියෝගයක විස්තර වී ඇති කිසියම් ක්‍රියා මාර්‍ගයක් කිසියම් ඉඩමක හෝ ඉඩමක් සම්බන්ධයෙන් අනුගමනය කිරීම කිසියම් ඉඩම් හිමියෙකු විසින් නොකර හැරියාවූ අවස්ථාවකදී නියමකළ හැකි ප්‍රමාණයේ කාල සීමාවක් දැනුම් දීමෙන් පසුව, ඒ සඳහා අධ්‍යක්ෂ තැනගෙන් ලිපියකින් බලය ලැබූ නිලධාරියෙකුගේ මාර්ගයෙන් එම ක්‍රියාමාර්ගය ඉටුකිරීමට අධ්‍යක්ෂවරයා විසින් සැලැස්වීම නීත්‍යානුකූල වන්නේය. එසේම, නියම ක්‍රියාමාර්ගයක් ඉටු කිරීම සඳහා ඔහුට අවශ්‍ය විය හැකි ප්‍රමාණයක් වෙනත් පුද්ගලයන් ද සමග එම ඉඩමට ඇතුල්වීමත්, ඇතුල්වී අවශ්‍යව ඇති සියලුම වැඩ කටයුතු කිරීමත් නීත්‍යානුකූල වන්නේය.

(2) අංක (1) දරණ උපවගන්තියෙන් පැවරී ඇති බලතල අනුව කිසියම් ඉඩමක හෝ ඉඩමක් සම්බන්ධයෙන් කරනු ලබන කිසියම් කටයුත්තක වියදම, නියමකළ හැකි අන්දමේ කොටස් ගෙවීම්වලින් ඉඩම්හිමියා විසින් ගෙවිය යුතුය. එබඳු කිසියම් කොටස් ගෙවීමක මුදල, ඉදින් නොගෙවන ලද නම් ආණ්ඩුවට අය විය යුතු ණයක් හැටියට සලකා සිවිල් නඩුවකින් එය අයකර ගත හැකිය.

9. (1) මෙම ආඥාපණත යටතේ අමාත්‍යවරයා විසින් සම්පාදනය කරනු ලබන සෑම නියෝගයක්ම අනුමතය සඳහා උත්තර මන්ත්‍රී මණ්ඩලය හා නියෝජිත මන්ත්‍රී මණ්ඩලය ඉදිරිපිටට ගෙන ආ යුතු අතර, ඉදින් අනුමත වුවහොත් ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කිරීමෙන් පසු එසේ ප්‍රසිද්ධකළ දින පටන් වලංගු වන්නේ ය.

(2) මෙම ආඥාපණතේ පරමාර්ථ හා කාර්ය ක්‍රියාවේ යොදවනු සඳහා අවශ්‍ය වන්නාවූ අනුකූලතාවය ලබා ගනු පිණිස, ඉඩම් හිමියන්ට, ගොවියන්ට හෝ අවශ්‍ය හැකි වෙනත් පුද්ගලයන්ට එබඳු නියෝග කිරීම සඳහාත්, එබඳු උපදෙස් සඳහාත්, එබඳු කිසියම් නිළධාරියෙකුට හෝ නියෝගයේ නියමකර ඇති වෙනත් පුද්ගලයෙකුට බලය දෙන්නට මෙම ආඥාපණත යටතේ සම්පාදිත කවර නියෝගයකට වුවද පිළිවන.

10. මෙම ආඥාපණතේ ප්‍රතිපත්ති හා කාර්ය ක්‍රියාවේ යෙදවීම හෝ වලංගු කරවීම සඳහා අවශ්‍ය විය හැකි අන්දමේ සියලුම නිලධාරීන් හා සේවකයන් පත්කර ගන්නට පිළිවන.

11. මෙම ආඥාපණත යටතේ සම්පාදිත කිසියම් නියෝගයක් හෝ එබඳු කිසියම් නියෝගයක් යටතේ කරන ලද හෝ දෙන ලද කිසියම් නියෝගයක් උපදේශයක් කඩ කරන්නාවූ නැතහොත් ඉටු නොකර හරින්නාවූ ද මෙම ආඥාපණත යටතේ අධ්‍යක්ෂවරයාට හෝ එබඳු නිළධාරියාට බලය දී හෝ පැවරී ඇති කිසියම් කාර්යක් හෝ යුතුකමක් කිරීමේදී හෝ ඉටු කිරීමේදී අධ්‍යක්ෂවරයාට හෝ එබඳු අනෙක් නිලධාරියෙකුට විරුද්ධ වන්නාවූ නැතහොත් බාධා කරන්නාවූ ද, කවර පුද්ගලයෙක් වුවද නීති කඩ කිරීමේ වරදකාරයා වන අතර මහෙස්ත්‍රාත් කෙනෙකු ඉදිරියේ නඩු විසඳීමකින් වරදකාරයා වීමේදී රුපියල් පන්සියයකට නොවැඩි දඩයකට යටත් වන්නේය.

12. මෙම ආඥපණතෙහි පද සංසනිදයෙන් සෙසු අර්ථයක් අනවශ්‍ය කල්හී ''අධ්‍යක්ෂ'' යනුවෙන් කෘෂිකර්ම අධ්‍යක්ෂවරයා අදහස් වන්නේය;

''අමාත්‍යවරයා'' යනුවෙන් කෘෂිකර්මය ඉඩම් පිළිබඳ අමාත්‍යවරයා අදහස් වන්නේ ය;

''හිමියා'' යන කිසියම් ඉඩමක් සම්බන්ධයෙන් යෙදෙන කල්හී, එම ඉඩමේ බදුකාරයා හෝ පොලීමරා උගස්කාරයා ද එහි ලා අන්තර්ගත වන්නේ ය;

''නියමිත'' යනුවෙන් මෙම ආඥාපණත යටතේ සම්පාදිත නියෝගවලින් නියමිත යන්න අදහස් වන්නේය.

## 1996 අංක 24 දරන පස සංරක්‍ෂණ (සංශෝධන) පනත

## (සහතිකය සටහන් කළේ 1966 අගෝස්තු මස 27 වන දින)

එල්.ඩී.ඕ. 48/92 පස සංරක්‍ෂණ පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :-

1. මෙම පනත 1966 අංක 24 දරන පස සංරක්‍ෂණ (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලබන අතර, ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මඟින් අමාත්‍යවරයා විසින් නියම කරනු ලබන යම් දිනයක එය ක්‍රියාත්මක විය යුතු ය.

2. (මෙහි මින් මතු ''ප්‍රධාන ප්‍රඥප්තිය'' යනුවෙන් සඳහන් කරනු ලබන) පස සංරක්‍ෂණ පනතේ දීර්ඝ නාමය වෙනුවට පහත දැක්වෙන දීර්ඝ නාමය ආදේශ කිරීමෙන් ඒ පනත මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

''පසෙහි නිෂ්පාදන ධාරිතාව වැඩි දියුණු කිරීම සහ පවත්වා ගෙන යාම සඳහා ද, තත්ත්වය පහත වැටී ඇති ඉඩම් යථා තත්ත්වයට පත් කිරීම සඳහා ද පාංශු ඛාදනය වැළැක්වීම හා අඩු කිරීම සඳහා ද පස සංරක්‍ෂණය කිරීම සහ ගංවතුර, ලවණතාව, ක්‍ෂාරත්වය සහ ජලය එකතුවීම සහ නියගයෙන් සිදුවන අලාභවලට එරෙහිව ඉඩම් ආරක්‍ෂා කිරීම සඳහා ද, ඊට සම්බන්ධ හෝ ආනුෂංගික කාරණා සඳහා ද විධිවිධාන සැලැස්වීම විගස වූ පනතකි ''

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 1 වන වගන්තියට ඉක්බිතිව පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුලත් කරනු ලබන අතර, ඒ වගන්තිය පිළිවෙලින් ප්‍රඥප්තියේ 1අ , 1ආ , 1ඇ , සහ 1ඈ වගන්ති වශයෙන් බල පැවැත්විය යුතු යඃ-

1අ (1) (මෙහි මින් මතු ''මණ්ඩලය '' යනුවෙන් සඳහන් කරනු ලබන) පස සංරක්‍ෂණ මණ්ඩලය නම් වූ මණ්ඩලයක් පිහිටවනු ලැබිය යුතුය.

(2) ආණ්ඩුක්‍රම ව්‍යාවස්ථාවේ 44 වන ව්‍යාවස්ථාව යටතේ කෘෂිකර්ම විෂයය භාරව සිටීම සඳහා පත්කරනු ලබන අමාත්‍යවරයා විසින් පත්කරනු ලබන පහත දැක්වෙන සාමාජිකයන්ගෙන් මණ්ඩලය සමන්විත විය යුතුය :-

(අ) අනුපිළිවෙලින් පහත දැක්වෙන විෂයයන් භාරව ආණ්ඩුක්‍රම ව්‍යාවස්ථාවේ 44 වන ව්‍යාවස්ථාව යටතේ පත් කරනු ලැබූ අමාත්‍යවරයන්ගෙන් අමාත්‍යාංශවල ලේකම්වරයන් -:

i පරිසරය;

ii ඉඩම්;

iii මහවැලි සංවර්ධනය;

iv නිවාස හා ඉදිකිරීම්;

v මහා මාර්ග;

vi වැවිලි කර්මාන්ත;

vii කෘෂිකර්මය;

viii මුදල්;

ix පළාත් සභා ;

x පතල් හා ඛනිජ;

xi වන සංරක්ෂණය;

xii වාරිමාර්ග;

(ආ) කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල්වරයා;

(ඇ) වෙරළ සංරක්ෂණ අධ්‍යක්ෂවරයා;

(ඈ) ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 4 දරන ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය පනත මගින් පිහිටුවනු ලැබූ ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ අධ්‍යක්ෂ ජනරාල්වරයා;

(ඉ) ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරියේ සභාපතිවරයා;

(ඊ) 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනත මගින් පිහිටුවනු ලැබූ මධ්‍යම පරිසර අධිකාරියේ සභාපතිවරයා ;

(උ) (මෙහි මින් මතු ''පත් කළ සාමාජිකයන් '' යනුවෙන් සඳහන් කරනු ලබන) පස සංරක්ෂණය හා ඉඩම් භාවිතයට අදාල කටයුතුවල නියැලී සිටින රාජ්‍ය නොවන ආයතන දෙකකින් එක් එක් නියෝජිතයා බැගින් නියෝජිතයන් දෙදෙනකු ;

(ඌ) මණ්ඩලය විසින් (අ) ඡේදයේ සඳහන් විෂයයන් හා සම්බන්ධ විශේෂ දැනුමක් ඇති තැනැත්තන් හෝ නිලධරයන් උපරිම වශයෙන් දෙදෙනකු අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව මණ්ඩලයට අමතරව එකතු කරගත හැකිය.

(3) පස සංරක්ෂණ මණ්ඩලයේ රැස්වීම්වල දී යම් නිශ්චිත පළාත් සභාවකට අදාළ කරුණු සාකච්ඡාවට ගන්නා විට පළාත් සභාවල කෘෂිකර්මය විෂයය භාර අමාත්‍යාංශවල ලේකම්වරුන්ට එම රැස්වීම්වලට සහභාගීවන ලෙසට ආරාධනය කළ හැකි ය.

(4) (අ) පත්කළ සාමාජිකයෙකුට, අමාත්‍යවරයා අමතා යවනු ලබන ලිපියක් මගින් ඕනෑම අවස්ථාවක සිය ධුරයෙන් ඉල්ලා අස්විය හැකිය.

(ආ) අමාත්‍යවරයා විසින් කිසිම හේතුවක් නොදක්වා, ඕනෑම අවස්ථාවක පත්කළ සාමාජිකයෙකු එම ධූරයෙන් ඉවත්කරනු ලැබිය හැකිය;

(ඇ) (අ) සහ (ආ) ඡේදවල විධිවිධානවලට යටත්ව, පත්කළ සාමාජිකයෙකුගේ ධූර කාලය අවු. 3ක් විය යුතුය;

(ඈ) පත්කළ සාමාජිකයෙකු මියයාම, ඉල්ලා අස්වීම, ධූරයෙන් ඉවත් කිරීම හෝ අන්‍යාකායකින් සිය ධූරයෙන් හිස්කරන අවස්ථාවක දී, අමාත්‍යවරයා විසින් ඔහු වෙනුවට, එම සාමාජිකයා අයත්ව සිටි රාජ්‍ය නොවන ආයතනයෙන් වෙනත් තැනැත්තකු පත් කරනු ලැබිය හැකිය; එසේ වුවද මේ ඡේදය යටතේ පත්කල සාමාජිකයකු ඔහුගේ පූර්වගාමියාගේ ධුර කාලයෙන් ඉකුත් නොවී ඇති කාලය තුළ ධූරය දැරිය යුතුය;

(ඉ) රෝගාතුර වීම හෝ අශක්නුතාවට පත්වීම නිසා හෝ ලංකාවෙන් බැහැරව සිටීම නිසා තම ධුරයේ කාර්ය ඉටු කිරීමට යම් සාමාජිකයකුට තාවකාලිකව නොහැකිවන අවස්ථාවක, අමාත්‍යවරයා විසින් ඔහු වෙනුවට වැඩ බැලීම සඳහා එකී සාමාජිකයා අයත් රාජ්‍ය නොවන සංවිධානයෙන් වෙනත් යම් තැනැත්තෙකු පත් කරනු ලැබිය හැකිය.

1ආ (1) ආණ්ඩුක්‍රම ව්‍යාවස්ථාවේ 44 වන වගන්තිය යටතේ කෘෂිකර්මය විෂය භාර අමාත්‍යවරයා ලෙස පත් කරනු ලැබ ඇති අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා මණ්ඩලයේ සභාපතිවරයා ලෙස ක්‍රියා කළ යුතුය.

(2) අධ්‍යක්ෂ ජනරාල්වරයා මණ්ඩලයේ ලේකම්වරයා ලෙස ක්‍රියාකළ යුතුය. 1ඇ. (1) මණ්ඩලයේ කර්තව්‍ය පහත සඳහන් පරිදි විය යුතුය:-

(අ) පහත සඳහන් කටයුතුවලට අදාළව ක්‍රියා මාර්ග යෝජනා කිරීම සහ ඒවාට අදාළ කටයුතු පර්යේෂණ හා වැඩපිළිවෙලවල් සම්බන්ධීකරණය කිරීම:-

i පසේ නිෂ්පාදන ධාරිතාව වැඩිදියුණු කිරීම හා පවත්වා ගෙන යාම;

ii යථා පරිදි වූ සංරක්ෂණ ක්‍රියාමාර්ග අඩුකම නිසා තත්ත්වය පහත වැටී ඇති ඉඩම්වල නිෂ්පාදන ධාරිතාව යථා තත්ත්වය පත් කිරීම;

iii තත්ත්වය පහත වැටීමේ ප්‍රවනතාව ඇති ඉඩම් ආරක්ෂා කිරීම;

iv පස සංරක්ෂණය හා එහි නිෂ්පාදන හැකියාව පවත්වා ගැනීමට අවශ්‍යවනතාක් ප්‍රමාණයට ජලය හා බෙදුම් සංරක්ෂණය කිරීම;

(ආ) කෘෂිකාර්මික නොවන ක්‍රියාකාරකම්වල ප්‍රතිඵලයක් වශයෙන් -

i කෘෂිකාර්මික ඉඩම්වල නිෂ්පාදන හැකියාව කෙරෙහි බලපෑමක් ඇතිවිය හැකි ප්‍රමාණයට එම ඉඩම්වල රොන්මඩ රැඳීම හෝ තත්ත්වය පහත වැටීමට ; සහ

i i කෘෂිකාර්මික නිෂ්පාදන හැකියාවට ආධාර වන දියබෙදුම් සහ වාරිමාර්ග පද්ධතිවල රොන්මඩ රැඳීමට තුඩු දිය හැකි පාංශු ඛාදනය වැළැක්වීම;

(ඇ) (I) ඈ වගන්තිය මඟින් පිහිටුවනු ලැබූ පස සංරක්ෂණ අරමුදල පරිපාලනය කිරීම හා කළමණාකරනය කිරීම;

(ඈ) මේ පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම පිළිබඳව අමාත්‍යවරයාට උපදෙස් දීම;

(2) මණ්ඩලයේ කාර්මික කටයුතු පහසුකර ගැනීමේ කාර්යය සඳහා, මණ්ඩලය විසින් ඉඩම් විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශය විසින් පිහිටුවන ලද පළාත්, දිස්ත්‍රික්ක සහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමේ ඉඩම් භාවිතය සැලසුම් කිරීමේ කමිටුව විසඳිය හැකිය.

1 ඈ. (I) ''පස සංරක්ෂණ අරමුදල '' නම් වූ අරමුදලක් පිහිටුවනු ලැබිය යුතුය.

(2) (අ) (i) අරමුදලේ ප්‍රයෝජනය සඳහා කලින් කළ පාර්ලිමේන්තුව විසින් සම්මත කරනු ලැබිය හැකි සියලු මුදල්;

(ii) මෙම පනත යටතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක් යටතේ හෝ අරමුදලක ගෙවීමට නියමිත සියලු මුදල්;

(iii) දේශීය හෝ විදේශීය ප්‍රභවයන්ගෙන් ලැබෙන යම් පරිත්‍යාග හෝ ප්‍රධාන;

(iv) අරමුදලට ගෙවිය යුතු මුදල් බවට මණ්ඩලය විසින් කලින් කළ තීරණය කරනු ලැබිය හැකි සියලු මුදල් අරමුදලට ගෙවනු ලැබිය යුතුය.

(ආ) මේ පනත යටතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක් යටතේ මණ්ඩලයේ බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේදී සහ ඉටු කිරීමේදී අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් දරනු ලබන වියදම් පියවීමට අවශ්‍ය සියලු මුදල් සහ මේ පනත මගින් හෝ එය යටතේ එකී අරමුදලින් ගෙවනු ලැබිය යුතුය.

**4.** ප්‍රඥප්තියේ **2** වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

**(1)** ඒ වගන්තියේ **(1)** වන උපවගන්තිය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් :-

''ගංවතුර, නියගය, ලවණීකරණය, නිසරුවීම, රොන්මඩ රැඳීම සහ පස සෝදයාම ඇතුළු විවිධ හේතූන් නිසා ඉඩම්වල තත්ත්වය පහත වැටීමේ ස්වභාවය හා ප්‍රමාණය දැනගැනීමේ කාර්යය හා මේ පනත යටතේ සංරක්ෂණ ප්‍රදේශ ලෙස තීරණයකළ යුත්තේ කවර ප්‍රදේශ ද යන්න අමාත්‍යවරයා විසින් තීරණය කිරීමේ කාර්යය සඳහා මිණුම් හා විමර්ශන සිදු කිරීමට කටයුතු සැලැස්වීම අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ කාර්යය විය යුතුය''

**(2)** එහි පැති සටහනේ ඇති ''පාංශු බාදනය'' යන වචන වෙනුවට ''ඉඩම්වල තත්ත්වය පහත වැටීම'' යන වචන ආදේශ කිරීමෙන්.

**5.** ප්‍රධාන ප්‍රඥප්තියේ **3** වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

**(1)** ''පාංශු බාදනය විය හැකි ප්‍රදේශයක් වශයෙන්'' යන වචන වෙනුවට සංරක්ෂණ ප්‍රදේශයක් වශයෙන් යන වචන ආදේශ කිරීමෙන්.

**(2)** එහි පැති සටහනේ ඇති පාංශු බාදන ප්‍රදේශය. යන වචන වෙනුවට ''සංරක්ෂණ ප්‍රදේශය'' යන වචන ආදේශ කිරීමෙන්.

**6.** ප්‍රධාන ප්‍රඥප්තියේ **4**වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

**(1)** ඒ වගන්තියේ ''පාංශු බාදන ප්‍රදේශය '' හා ''පාංශු බාදන ප්‍රදේශ '' යන වචන යෙදෙන කවර හෝ විටෙක පිළිවෙලින් සංරක්ෂණ ප්‍රදේශය හා සංරක්ෂණ ප්‍රදේශ යන වචන ආදේශ කිරීමෙන්;

(2) එහි (ආ) ඡේදයට ඉක්බිතිව පහත දැක්වෙන අලුත් ඡේදය ඇතුලත් කිරීමෙන් :- ''යම් දිය පාරක ඉවුර සෝදයාම සිදුවිය හැකි ලෙස එම දිය පාරෙන් හෝ දිය පාරේ ඉවුරුවලින් යම් ද්‍රව්‍යයක් භාරා ඉවත් කිරීම හෝ එම දිය පාරට හෝ දිය පාරේ ඉවුරට යම් ද්‍රව්‍යයක් දැමීම තහනම් කිරීම හෝ සීමා කිරීම ''

(3) ඒ වගන්තියේ (ඉ) ඡේදයට ඉක්බිතිවම පහත දැක්වෙන අලුත් ඡේදය එකතු කිරීමෙන් :- ''(ඊ) තත්ත්වය පහත වැටී ඇති ඉඩම්වල ඵලදායීතාව වැඩිකිරීම සඳහා අනුගමනය කළයුතු ක්‍රියාමාර්ග සම්බන්ධයෙන් විධාන දීමට යම් නියමිත නිලධරයෙකුට හෝ තැනැත්තකුට බලය පැවරීම.

(උ) ජලය හෝ දිය බෙදුම සංරක්ෂණය කිරීම සඳහා අනුගමනය කළ යුතු ක්‍රියාමාර්ගය සම්බන්ධයෙන් විධාන දීමට යම් නියමිත නිලධරයෙකුට හෝ තැනැත්තකුට බලය පැවරීම ''

7. ප්‍රධාන ප්‍රඥප්තියේ 5වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) ''පාංශු ඛාදන ප්‍රදේශ'' හා ''ඛාදනය'' යන වචන වෙනුවට පිළිවෙලින් ''සංරක්ෂණ ප්‍රදේශ'' හා ''තත්ත්වය'' පහත වැටීම යන වචන ආදේශ කිරීමෙන්:

(2) එහි පැති සටහනේ ඇති ඛාදනය යන වචනය වෙනුවට තත්ත්වය පහත වැටීම යන වචන ආදේශ කිරීමෙන්

8. ප්‍රධාන ප්‍රඥප්තියේ 5 වන වගන්තියට ඉක්බිතිව පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුලත් කරනු ලබන අතර, එය ප්‍රධාන ප්‍රඥප්තියේ 5අ වගන්තිය ලෙස බලාත්මක විය යුතුය :-

5 අ. මේ පනත මගින් හෝ එය යටතේ අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත පවරනු ලැබූ හෝ නියම කරනු ලැබූ හෝ වෙන්කර දෙනු ලැබූ යම් බලතල, කාර්ය හෝ කර්තව්‍ය අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් කොට්ඨාශයක් භාර ප්‍රාදේශීය ලේකම්වරයා, වෙත පවරනු ලැබිය හැකිය

9. ප්‍රධාන ප්‍රඥප්තියේ 6 වන වගන්තියේ (ඉ) උපවගන්තියට ඉක්බිතිවම පහත දැක්වෙන උපවගන්ති ඇතුළත් කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

" (ඉඉ) තත්ත්වය පහත වැටීමට භාජනය විය හැකි ඉඩම් ආරක්ෂා කිරීම සඳහා සහ එවැනි ඉඩම්වල නිෂ්පාදන ධාරිතාව වැඩි කිරීම සඳහා එම ඉඩම්වල අයිතිකරුවන් විසින් ගත යුතු ක්‍රියා මාර්ග "

10. ප්‍රධාන ප්‍රඥප්තියේ 11 වන වගන්තියේ ඇති " රුපියල් පන්සියයකට නොවැඩි දඩයකට" යන වචන වෙනුවට " රුපියල් එක් දහසකට අඩු නොවන හා රුපියල් පන්දහසකට වැඩි නොවන දඩයකට" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

11. ප්‍රධාන ප්‍රඥප්තියේ 12 වන වගන්තිය මෙයින් ඉවත් කරන අතර පහත දැක්වෙන වගන්තිය ඒ වෙනුවට ආදේශ කරනු ලැබේ:-

12. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මේ පනතෙහි -

" මණ්ඩලය යන්නෙන් 1අ වගන්ති මඟින් පිහිටුවන ලද පස සංරක්ෂණ මණ්ඩලය අදහස් වේ;

" අධ්‍යක්ෂ ජනරාල්වරයා " යන්නෙන් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා අදහස් වේ;

" අරමුදල " යන්නෙන් 1ඈ වගන්තිය මඟින් පිහිටුවන ලද පස සංරක්ෂණ අරමුදල අදහස් වේ.

" අයිතිකරු " යන්න යම් ඉඩමක් සම්බන්ධයෙන් යෙදුනු විට ඉඩමේ බදු ගැනුම්කරු හෝ උගස් ගැනුම්කරු ඊට ඇතුළත් වේ;

" ජලාශ " යන්නට, ජලාශ, කෘත්‍රිම වැව්, ගංගා දියපහරවල්, ඇළවල් සහ කඳුරු ඇතුළත් වේ.

12. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතුය.